# මට විරුද්ධව ඇති පදනම් විරහිත චෝදනා




## හජ්ජුල් අක්බර්

හිටපු සභාපති ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි (1994 - 2018)


2021.03.11

# මට විරුද්ධව ඇති පදනම් විරහිත චෝදනා

## හජ්ජුල් අක්බර්

හිටපු සභාපති ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි (1994 - 2018)

2021.03.11

# මෙහි අන්තර්ගතය

1. පිවිසීමට පෙර
2. මට එරෙහිව ඇති චෝදනා සම්බන්ධයෙන්
3. මම ප්‍රසිද්ධියේ ජීවත්වුණු කෙනෙක්
4. ඉස්ලාමයේ ඇති මතභේදය හෝ රටේ ආගම් භේදය හෝ මාව නොඉවසිලිවන්තයෙකු කළේ නැත.
5. ඉස්ලාමය සම්බන්ධ මගේ එළඹුම
6. ඉස්ලාමීය රාජ්‍ය යන ව්‍යාජ චෝදනාව
7. ඉස්ලාමීය රාජ්‍ය චෝදනාවට මගේ පිළිතුර
8. මාත් මෙම චින්තනයට විරුද්ධයි
9. කොමිසමේ මට විරුද්ධව පැමිණි සාක්ෂි
10. බුද්ධි අංශයට තොරතුරු ලබා දෙන ලදී
11. සාදික් සම්බන්ධයෙන් මට විරුද්ධව එල්ල කළ චෝදනා
12. අල් හසනාතය ජිහාදයට පෙළඹවූයේ නැත.
13. අන්තවාදී බිහිවෙන්නේ කෙසේද? අන්තවාදීන් ලබාදුන් සාක්ෂි
14. මාව හඳුනන අය මාව අන්තවාදියෙකු ලෙස නොබලයි.
15. ජන මනෝභාවය අන්තවාදයට විරුද්ධයි
16. ඉස්ලාමීය රාජ්‍ය සාර්ථක වන්නේ කෙසේද? ඔබ පිළිතුරු දිය යුතුය.
17. හජ්ජුල් අක්බර්ගේ ස්ථාවරය
18. අවසාන වශයෙන්...

# 01. පිවිසීමට පෙර...

පාස්කු ඉරිදා ප්‍රහාරයේ මහ මොළකරු කව්රුන්ද? පාස්කු ප්‍රහාරය සම්බන්ධ විමර්ශනය කිරීමට පත් කළ ජනාධිපති කොමිසම් වාර්ථාවේ ඒ පිළිබඳ කිසිවක් සඳහන් වී නැත. අප්‍රේල් 21 ප්‍රහාරයේ පසුබිම සම්බන්ධ කරුණු කොමිසමේ මුළුමනින්ම සඟවා ඇති බවත් එම නිසා එම වාර්ථාව පිළිගත නොහැකි බව බොහෝ පාර්ශවයන් කරුණු ඉදිරිපත් කරන පරිසරයක...

එක් අවස්ථාවක අන්තාවාදීන් සඳහන් කරන ලදී. තවත් විටෙක පුද්ගලයෙකුගේ නම එයට සම්බන්ධ වේ. තවත් විටෙක ඉස්ලාමීය සංවිධාන බව පෙන්වීමට කටයුතු කෙරේ. තවත් පිරිසක් සහරාන් මෙහි මහ මොළකරු බව කියති.

මහ මොළකරු කව්රුන්ද යන්න පිළිබඳ අර්බුදකාරී තත්තවයක් පැනනැගී ඇති බව මෙයින් පෙන්නුම් කෙරේ. කාගේ හෝ හිසේ මෙය පටවමු යන උත්සාහයකුත් පෙනෙන්නට තිබේ.

මෙම තත්තවය යටතේ සත්‍ය දත් පිරිසක් රටේ සිටිනවා යන විශ්වාසය හිතට සහනයක් ගෙන දේ. ඔවුන් මෙහි විමර්ශනකරුවන් වන අධිකරණයට සම්බන්ධ අය බව කිව හැකිය.

ඔවුන් යම් කථාවක් කියා එය වෙනත් ස්ථානයක් සමග ගැට ගසන අය නොවේ. ඔවුන් සත්‍ය දැන ගැනීමට ඇති ක්‍රියාවලිය විශ්වාස කරන අය වේ. එවැනි පිරිසකගේ දැන ගැනීම සඳහා මා පිළිබඳව සත්‍ය කරුණු ඉදිරිපත් කරමි.

**ආර්. හජ්ජුල් අක්බර්**
**2021.03.11**

# 02. මට එරෙහිව ඇති චෝදනා සම්බන්ධයෙන්

පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කළ ජනාධිපති කොමිසමේ වාර්තාව විවිධ අය විවිධ ආකාරයෙන් විවේචනය කරන අතර එය පිළිගත නොහැකි බව කියන පිරිසකුත් සිටිති.

මම එම වාර්තාවෙන් කම්පනයට පත්වූ අයගෙන් කෙනෙකි. වාර්තාවෙන් මට එල්ල කර ඇති චෝදනා දෙස බලන විට මා සම්බන්ධ සත්‍ය තත්තවය ප්‍රතික්ෂේප කර ව්‍යාජ හා බියජනක ප්‍රතිරූපයක් දක්වා ඇති බව පෙනේ.

මා 2019 වර්ෂයේ දී අත්අඩංගුවට පත්වී නිදහස් කරන ලද අයෙකු වශයෙන් සඳහන් කළ යුතු කරුණක් ඇත.

මාව අත්අඩංගුවට ගත් අය කිසිම චෝදනාවක් පනවා අත්අඩංගුවට ගත්තේ නැත. කට උත්තරයක් ගැනීමට යැයි කියා කැඳවාගෙන ගොස් පසුව අත්අඩංගුවට ගෙන ඇති බව දැනුම් දුන්හ.

එසේ කැඳවාගෙන ගිය දිනට පසුවදා සිංහල පුවත්පත් මට විරුද්ධව ඇති සියලු චෝදනා විමර්ශය කර ඔප්පු කර ඇති ආකාරයට ප්‍රවෘත්ති මුල් පිටුවල පළ කළේය. එම සියලු චෝදනා පදනම් විරහිත බව එම කාලයේම අපේ ජනයා කථා කළහ. මාගේ සැබෑ තත්තවය අවධාරණය කර ලිවීමට හා කථා කිරීමට

කටයුතු කළහ. එදා පුවත්පත්වල එළවූ එම චෝදනාම ජනාධිපති කොමිසම් වාර්ථාවේද සඳහන්වී ඇත. එම පසුබිමේ සිට බැලීමේදී මෙම චෝදනා විමර්ශනයකින් පසු අනාවරණය කරගත් ඒවා නොව කව්දෝ පෙර තීරණය අනුව සකස් කළ ඒවා බව පෙනේ. එම නිසා මේ සියලු චෝදනා මා තරයේ ප්‍රතික්ෂේප කරමි. මෙම සියලු චෝදනා පිළිබඳ විමර්ශනය කිරීමෙන් පසු අත්අඩංගුවෙන් මා මුදවාහරිනු ලැබූ බවද මෙහිදී විශේෂයෙන් සඳහන් කරමි.

## 03. මම ප්‍රසිද්ධියේ ජීවත්වුන කෙනෙකි.

මේ වන විට මගේ වයස අවුරුදු 60 කි. මේ දක්වා මා ජීවත්වී ඇත්තේ ශ්‍රී ලංකාවේය. සතියක් දින පහක් හෝ හතරක් වැනි කෙටි කාලයක් සඳහා වෙනත් රටවලට ගමන් කිරීමට අමතරව මගේ අධ්‍යාපනය හා වෘත්තීය ජීවිතය මුළුමනින්ම ගත කර ඇත්තේ ශ්‍රී ලංකාවේය.

නාවලපිටිය ශාන්ත මරියා විද්‍යාලයෙන් අපොස සා.පෙළ දක්වා ඉගෙන ගත් මා බේරුවල ජාමියියා නලීමියාවේ ඉස්ලාමීය අධ්‍යාපනය හැදෑරුවෙමි. වසර 7 ක් එහි ගත කළ පසු මාදම්පේ ජුම්ආ පල්ලියේ සේවය සඳහා බැඳුනෙමි. ඉන් අනතුරුව 1987 මාදම්පේ ස්ථාපිත කළ ඉස්ලාහියා අරාබි විද්‍යාලයේ ගුරුවරයෙක් වශයෙන් හා පසුව එහි විදුහල්පති වශයෙන්ද සේවය කළෙමි. මෙම කාල පරිච්ඡේදයේදී ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි සංවිධානයේ සාමාජිකත්වය ලබාගත් මම 1994 දක්වා ඉස්ලාහියා විද්‍යාලයේ සේවය කර 1994 දී ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමියේ සභාපති වශයෙන් තෝරාපත් වුනෙමි. ඒ සමගම ඉස්ලාහියාවේ රැකියාවට සමුදුන් මා ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමියේ සභාපති ධූරයේ 2018 දක්වා කටයුතු කළෙමි. දැනට එම සංවිධාන-යේ මධ්‍යම කාරක සභා සභිකයෙක් වශයෙන් කටයුතු කරමි.

මෙය මගේ ජීවන කථාවේ සාරාංශයයි. මෙහිදී අපැහැදිලිව අදෘශ්‍යමාන කිසිවක් නැතැයි මා විශ්වාස කරමි.

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමියේ සභාපති වශයෙන් කටයුතු කරන කාලයේ අරමුණු 3 ක් වෙනුවෙන් කෙටිකාලීන විදෙස් ගමන් වලට සහභාගිවී ඇත්තෙමි.

1. ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි සංවිධානයට ලැබුණු නිල ආරාධාන පිළි අරගෙන සම්මන්ත්‍රණ වලට සහභාගි වීම. (මේ සඳහාවූ සියලු වියදම් දරන්නේ සම්මන්ත්‍රණයේ සංවිධායකවරුන්ය. එසේ නොමැති අවස්ථාවල සාමාන්‍යයෙන් එවැනි ගමන් වලට සහභාගි වන්නේ නැත. එම ගමන් සඳහාවූ වීසා ලබා දී ඇත්තේද එම රටවල් වලිනි)

2. විදෙස් රටවල ජීවත්වන ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් (විශේෂයෙන් මැදපෙරදිග රටවල) රමළාන් කාලයේ හෝ ග්‍රීස්ම නිවාඩු කාලයේ සංවිධානය කරන ආගමික සංස්කෘතික අවස්ථා වලට සම්පත්දාරියෙක් වශයෙන් සහභාගි වීම. (එවැනි වැඩසටහන් අදාල රටවල රජයේ ආගමික කටයුතු අමාත්‍යංශවල අවසරය මත සංවිධානය කෙරේ. මේ සඳහාවූ ගමන් වියදම් ගෙවනු ලබන්නේද සංවිධායකවරුන් විසිනි.)

3. හජ් සහ උම්රා වගකීම ඉටු කිරීම

කොමිසම ඉදිරියේ මේ සියලු තොරතුරු සපයා ඇත. උපන්දා සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ ඉතා ප්‍රසිද්ධියේම ජීවත් වුණු මා පාසැල් අවධියේ රැකියා කරන කාලයේ හා ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමියේ කටයුතු කරන කාලයේ සමාජය සමග සම්මිශ්‍රව ජීවත්වී ඇත්තෙමි. කිසිවිටකත් රහස්‍ය ජීවිතයක් ගත කර නැත. මගේ රචනා, කථා, ක්‍රියා හා සම්බන්ධතා සියල්ල පාරදෘශ්‍ය

බවයෙන් යුක්තය.

එපමණක් නොව මේ දක්වා මගේ ජීවිත කාලයේ කිසිම වරදකට මා සම්බන්ධ බවට චෝදනාවට ලක්වී නොමැත. මගේ කිසිම සම්බන්ධතා නීතියට පටහැනි බව හෝ නීත්‍යානුකූල නොවන ආකාරයට නොතිබුණි.

## 04. ඉස්ලාමයේ ඇති මතභේද හෝ රටේ ඇති ආගම්භේද හෝ මාව නොඉවසිලිවන්තයෙක් කර නොමැත.

ආගමික කරුණු වලදී මා සමග මතභේද ඇති කරගත් අය නොසිටියා නොවේ. ආගමිකයන් අතර පොදුවේ කුඩා කොටස් හෝ පාර්ශවයන් දක්නට ලැබීම හා ඒ ආශ්‍රයෙන් මතභේද ඇතිවීම සාමාන්‍ය කාරණයක් බව සැවොම දනී. ඒවගේම ඉස්ලාමය අනුගමනය කරන්නන් අතරද එවැනි මතභේද ඇත.

මෙම මතභේද හේතුවෙන් අතලොස්සක්වූ කිහිපදෙනෙක් මාව ප්‍රසිද්ධියේ විවේචනයට ලක් කර ඇත. එහෙත් පෙරළා ඔවුන්ව විවේචනය කිරීමට තරම් නොඉවසිලිවන්ත තත්තවයට මා ගොස් නැත.

එසේ මාව සහ මා සාමාජිකත්වය දරන ජමාඅතේ ඉස්ලාමිය දැඩි ලෙස විවේචනය කරමින් අප නිරයට නියමවූ මිනිසුන් බව තීන්දු කළ අයෙක් වශයෙන් සහරාන් හාෂිම්ව සඳහන් කළ හැකිය. වරක් ඔහු ඒ බව අපට ඔප්පු කිරීම සඳහා වාදයකට සහභාගි වන්නැයි, දුරකථනය මගින් ආරාධනය කළේය. මා ඉස්ලමය සම්බන්ධයෙන් වාද විවාද කරන මනෝභාවයක් ඇති

පුද්ගලයෙකු නොවන නිසා එම ආරාධනය ප්‍රතික්ෂේප කළෙමි. මා හා සහරාන් අතර වූ එම දුරකථන සංවාදය සහරාන් විසින් පටිගත කර යූ ටියුබයේ බාගත කර තිබුණි. එහි පිටපතක්ද කොමිසමට භාරදී ඇත.

මම ආගමික සංහිඳියාවෙන් තොර වෛරී කථාවල නිරතවන්නෙක් බව කොමිසම් වාර්ථාවේ චෝදනාවක් ඇත මා මුස්ලිම්වරුන් අතර ඇති ඉස්ලාමීය සංවිධාන අශිෂ්ට ලෙස විවේචනය කර හෝ සෙසු ආගම්වලට අයත් පිරිස අශිෂ්ට අන්දමින් විවේචනය කර හෝ නැත. එසේ කළ බව සාක්ෂියක්ද නැත. මාගේ කථා හා රචනා පිළිබඳ දැනුවත් දහස් ගණන් පිරිස මෙයට සාක්ෂි දරනු ඇත.

සිංහල මාධ්‍යයෙන් කථා කරන හෝ ලියන අයෙකු වශයෙන් මා සිටියෙ නම් ඔවුන්ද මෙම සත්‍යය අවබෝධ කරනු ඇති බව මගේ විශ්වාසයයි.

## 05. ඉස්ලාම් සම්බන්ධ මගේ එළඹුම

ඉස්ලාම් සම්බන්ධව මා රචනා කළ ලිපිවල හා මාගේ කථාවල එක් චින්තන ශෛලයක් අනුගමනය කළ බව කිව යුතුය. එක් එක් මුස්ලිම්වරයෙක්ම තම ජීවිතයේ තම ආගමට මුල්තැන දිය යුතුයි යන්න අවධාරණය කිරීම එම චින්තන ශෛලයයි. එනම් හැකි තරම් ඉස්ලාමය පිළිබඳ හදාරා තම ජීවිතයේ එය උපරිම අන්දමින් ක්‍රියාත්මක කිරීමේ වගකීම එක් එක් මුස්ලිම්වරයෙකුටම ඇති බව මම අවධාරණය කළෙමි. එහෙත් එම වගකීම ප්‍රචණ්ඩ මාර්ගවලින් හෝ නීත්‍යානුකූල නොවන ආකාරයට හෝ ක්‍රියාත්මක කළ යුතුයි යන අදහසේ මා කිසිදා සිටියේ නැත. වෙනස්ව මුස්ලිම් නොවන්නන් පවා

ඉස්ලාමය කෙරෙහි යහපත් මතයක් ඇති කරගන්නා ආකාරයෙන් මුස්ලිම්වරුන් ජීවත්විය යුතුයි යන්න එහි අපේක්ෂාව විය. එම අපේක්ෂාවට එරෙහිව යන මුස්ලිම්වරුන්ගේ ක්‍රියාපටිපාටි හා ගුණාංග මාගේ විවේචනයට ලක්වී ඇත. එහෙත් ඉස්ලාමයේ කිසිම ඉගෙන්වීමක් සම්බන්ධයෙන් කිසිම මුස්ලිම්වරයෙකුට බලකිරීමක් කර නොමැත.

මෙවැනි මගේ චින්තන ප්‍රවණතාව හා එළඹුම කොමිසම විසින් අවබෝධ කරගෙන නොමැතිවීම කණගාටුවට හේතුවකි.

## 06. "ඉස්ලාමීය රාජ්‍ය" නමැති ව්‍යාජ චෝදනාව

මට විරුද්ධව කර ඇති තවත් චෝදනාවක් වනුයේ අරාබි විද්‍යාල වල ඉස්ලාමීය ෂරීආව සම්පූර්ණයෙන් උගන්වන බව මා කියා ඇති බවත් ෂරීආව මෙරටේ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කළ යුතු බව කියා ඉස්ලාමීය රාජ්‍යක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කළ යුතු බවට මුස්ලිම්රුන් පොළඹවූ බවත් කොමිසම් වාර්ථාවේ සඳහන් වී ඇත.

අරාබි විද්‍යාලවල ෂරීආ ඉගෙන්වීම සම්බන්ධයෙන් මා සඳහන් කළ දේ මෙසේය.

ශ්‍රී ලංකාවේ පුද්ගලයින් තම ජීවිතයේ පිළිපැදිය යුතු ආගමික නීති රීති මද්රසාවල උගන්වනු ලබයි. (නිදසුනඃ නැමදුම, උපවාසය, සකාත්, හජ්, පවුල් ජීවිතය, වෙළඳාම සම්බන්ධ නීති) අනෙකුත් ඒවා බොහෝ දුරට උගන්වන්නේ නැත. (නිදසුනඃ අපරාධ නීති) ඇතැම් අවස්ථාවලදී ඒවා උගන්වනු ලැබුවත් ශ්‍රී ලංකාව වැනි රටවල ඒවා ක්‍රියාත්මක කළ නොහැකි බව අවබෝධ කර දෙනු ලැබේ.

මා කොමිසමට ඉදිරිපත් කළේ මෙවැනි අදහසකි. මාගේ සිංහල භාෂා දැනුමේ ඇති දුර්වලතාවය මෙහිදී සඳහන් කළ යුත්තකි. මා විසින් කියන ලද අදහස් ඔවුන් විසින් තේරුම් ගනු ලැබුවේ කොයි ආකාරයටද යන්නෙහි ප්‍රශ්නයක් තිබිය හැකිය. පසුව මාගේ නීතිඥයාගේ උපදෙස් අනුව පරිවර්තකයෙකු යොදාගත යුතු බව කොමිසමට කියා එය ලබා ගත්තෙමි.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ෂරීආව මුළුමනින්ම ක්‍රියාත්මක කළ යුතු බව හා ශ්‍රී ලංකාවේ ඉස්ලාමීයිය රාජ්‍යක් ස්ථාපිත කළ යුතු බව යන චින්තනයෙන් යුතුව මා පසුවනවා යන චෝදනාව විවිධ දෘෂ්ඨී කෝණවලින් ප්‍රතික්ෂේප විය යුත්තකි.

## 07. ඉස්ලාමය රාජ්‍ය යන චෝදනාවට පිළිතුරු

### මෙය ජමාඅතේ ඉස්ලාමිය අනුමත නොකරන කාරණයකි

මෙම චින්තනයෙන් යුතුව මා සිටියේ නම් හෝ මෙම චින්තනය කරා විවිධ අය පොළඹවා මෙහෙයවන්නෙක් හැටියට මා සිටියේ නම් හෝ මට විරුද්ධව පියවරක් ගන්න ඉදිරිපත් වන පළමු සංවිධානය වනුයේ ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමියයි.

ඒ සඳහා එක් නිදර්ශනයක් පහත සිද්ධියෙන් උපුටා දැක්විය හැකිය.

1980 දශකයේ ඉරානයේ ආයතුල්ලා කොමේනි නැමැත්තා ඉස්ලාමීය විප්ලවයක් සංවිධානය කර ඇමෙරිකා සහයෝගයෙන් පාලනය කළ ෂා රජුගේ පාලනය අහෝසි කළේය. ඒ අවස්ථාවේ මුස්ලිම් ලෝකයේ බොහෝ තැන්වල ආයතුල්ලා කොමේනිට පක්ෂව කථා කරන තත්තවයක් ඇති විය. ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලමියේ එවකට හිටපු සභාපතිවරයකු වශයෙන් සිටි යූසුෆ්

හාජියාර් නමැත්තා ආයතුල්ලා කොමේනිට පක්ෂපාතිත්වයක් දැක්වූයේය. ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමියද එම ස්ථාවරය ගත යුතු බව ඔහු අවධාරණය කළේය.

ඇමෙරිකා අධිරාජ්‍යයට විරුද්ධව ඉරානයට පක්ෂපාතිත්වය දැක්වීම එකක් බවත් කොමේනිව විප්ලවීය නායකයා වශයෙන් පිළි අරගෙන ඔහු පසු පස ගමන් කිරීම තවත් එකක් බවත් කිව යුතුය. මෙම දෙවැනි ස්ථාවරය ගත නොහැකි බව ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමිය එදා ස්ථිර වශයෙන් තීරණය කළේය. එම නිසා හිටපු සභාපති හා අනෙක් අය අතර මතභේද උත්සන්න වී හිටපු සභාපතිවරයා ඉවත් කළ යුතු බවට තීරණය කළ විට ඔහු සාමාජිකත්වයෙන් ඉවත්ව ගියේය.

මා මෙම සිද්ධිය වූ අවස්ථාවේ ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමිය සමග මට කිසිම සම්බන්ධයක් තිබුණේ නැත. ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමියට බැදුණේ 1987 දීය.

මුස්ලිම් ලෝකයේ විප්ලවයක් මගින් පිහිටුවා ගත් රජයකට පක්ෂ පාතිත්වය දැක්වීම ප්‍රතික්ෂේප කර තම හිටපු සභාපතිවරාය ඉවත් කිරීමට තීරණය කළ ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමීය සංවිධානයේ පසු කාලයේ සභාපතිවරයෙක් විප්ලවයක් කිරීමට හෝ විප්ලවීය අදහසක් අනුමත කිරීම කිසිසේත් සිදුවිය නොහැකිය.

ඉස්ලාමීය රාජ්‍යයක් ස්ථාපිත කිරීමට මා පෙළඹ වූයේ නම් මට විරුද්ධව ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමිය පියවර ගැනීම සහතිකයි.

# 08. මාත් මෙම චින්තනයට විරුද්ධයි.

තවත් කෝණයකින්ද මෙම චෝදනාව මම ප්‍රතික්ෂේප කරමි. ඒ සඳහාද සිද්ධියක් ඉදිරිපත් කරමි.

එම සිද්ධියේ ප්‍රධාන චරිතය අබ්දුල් ගෆූර් මොහම්මද් නදීර් නමැත්තෙකි. 1987 දී ඉස්ලාහියා අරාබි විද්‍යාලය ආරම්භ කළ අවස්ථාවේ එවකට සිටි පාලක සභාව නදීර් මහතාව එහි විදුහල්පති වශයෙන් පත් කළේය. එහි ගුරුවරයෙක් වශයෙන් මමද කටයුතු කළෙමි.

නදීර් මෞලවි මුලදී හොඳින් කටයුතු කරගෙන ගියේය. අතරමගදී ඔහුගේ චින්තනයේ යම් වෙනසක් ඇති වූ බව අවබෝධ විය. ඔහු සෙමින් සෙමින් ශිෂ්‍යයන් අතර අන්තවාදී අදහස් කථා කිරීමට පටන් ගත්තේය. එම අදහස් කෙටියෙන් මෙසේය.

"මුස්ලිම් නොවන සියලුදෙනාටම අප ප්‍රසිද්ධියේම ඉස්ලාමය ප්‍රචාරය කළ යුතුය. මුස්ලිම්වරුන් ෂරීආ නීතිය මුළුමනින්ම පිළිපැදිය යුතුය. ශ්‍රී ලංකාවේ නීති වලට ඔවුන් ගරු කළ යුතු නැත. ශ්‍රී ලංකා රජයෙන් නිකුත් කර ඇති හැඳුනුම්පත, රියදුරු බල පලත්‍ර, උප්පැන්න සහතික අපට අවශ්‍ය නැත. අපගේ දරුවන් රජයේ පාසලට යැවිය යුතු නැත. එහි අධ්‍යාපනය අපට විරුද්ධයි."

ඔහුගේ මෙම අන්තවාදී චින්තනය ශිෂ්‍යයන් අතර පතුරන බවට ඇතැම් ශිෂ්‍යයෝ මා සමග කීහ. වහාම විද්‍යාලයේ කළමනාකරණයට මේ බව දැනුවත් කළෙමි. වහාම ඔහුව ඉවත් කළ යුතු බවට එහිදී තීරණය කරන ලදී. ඉන්පසුව වහාම ඔහුව ඉවත් කරන ලදී.

ඔහුගේ ඉවත් වීමෙන් පසුද ඇතැම් ශිෂ්‍යයන් තුළ ඔහුගේ

අන්තවාදී චින්තන ඇති බව හඳුනා ගන්නට පුළුවන් විය. වහාම ඔවුන්ව එයින් මුදවාගත යුතු අවශ්‍යතාවයක් ඇති විය. එම වැඩසටහන මා හට භාරදෙන ලදී.

පන්තියේ සිටි ශිෂ්‍යයන් 24 දෙනාගෙන් එක් අයෙකු හෝ නදීර් මෞලවිගේ චින්තනයට නොගොස් ආරක්ෂා කරගැනීමට පුළුවන්වීම පිළිබඳ අදටත් මම සතුටුවෙමි.

නදීර් මෞලවි ඉස්ලාහියාවෙන් ඉවත් වීමෙන් පසු පුත්තලමේ තවත් පිරිසක් එකතු කරගෙන අන්තවාදී චින්තනය පතුරවීමෙ උත්සාහයක නිතරවිය. ඔහු සමග ජමාඅතේ ඉස්ලාමියෙන් හෝ ඉස්ලාමීය ශිෂ්‍ය සංවිධානයෙන් හෝ කිසිවෙකු එකතුවූ නැති බව කිව යුතුය. මෙය සිදුවූයේ 1988 - 89 කාලයේය.

කොමිසමට ලබාදුන් සාක්ෂියේදී මේ පිළිබඳව මා ඉදිරිපත් කළ අතර කොමිසම් වාර්ථාවේදීද එය අන්තර්ගත වී ඇත. එහෙත් කොමිසම් වාර්තාව මාව අන්තවාදියෙක් බව හඳුන්වා දී ඇත.

## 09. කොමිසමේ මට විරුද්ධව ලබාදුන් සාක්ෂි පිළිබඳව

මාගේ දැනුමේ හැටියට ජමාඅතේ ඉස්ලාමියට එරෙහිව හා මට එරෙහිව පදනම් විරහිත චෝදනා ඉදිරිපත් කරමින් සාක්ෂි දී ඇත්තේ පහත අය විය හැකිය.

- ගලගොඩ අත්තේ ඥානසාර හාමුදුරුවන් කොමිසමේ ලබාදුන් සාක්ෂිඃ එහිදී ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි ඇතුලු මුස්ලිම් සංවිධාන 43 ක් ගැන සඳහන් කර ඒවා තහනම් කළ යුතු බව ඉල්ලා තිබුණි.

මෙ සම්බන්ධයෙන් මුස්ලිම් සංවිධාන එකතුව තම විරුද්ධතාවය කොමිසමට ලිඛිතව ඉදිරිපත් කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්

ඥානසාර හාමුදුරුවන්ගෙන් හරස් ප්‍රශ්න කිරීමේ අවකාශය ජමාඅතේ ඉස්ලාමිය ඇතුළු සංවිධාන කිහිපයකට ලැබුණි. ජමාඅතේ ඉස්ලාමිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ එන්.එම්. ෂහීඩ් මහතා "ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමියේ හිටපු සභාපති හජ්ජුල් අක්බර් අත්අඩංගුවට ගෙන විමර්ශනය කර ඔබ වහන්සේ නගන සියලු චෝදනාවලින් අධිකරණයෙන් නිදහස් කළ බව ඔබ වහන්සේ දන්නේද" යනුවෙන් විමසීය. එයට පිළිතුරු වශයෙන් උන් වහන්සේ "ඔව්" යනුවෙන් කිව්වේය. එසේ නම් ඔහු සහ ඔහු අයත් සංවිධානය නිර්දෝශී දැයි ඔබ වහන්සේ පිළිගන්නේද යනුවෙන් නීතිඥවරයා ඇසූ විට "පැමිණිලි කිරීම අපේ වැඩක් විමර්ශනය කිරීම ඔවුන්ගේ වැඩක්" යැයි පිළිතුරු දුන්නේය. ඥානසාර හාමුදුරුවන් වහන්සේත් ඇත්ත වශයෙන්ම ජමාඅතේ ඉස්ලාමිය පිළිබඳව කිසිවක් දන්නේ නැති බවයි අපි විශ්වාස කරන්නේ. ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි සංවිධානයෙන් හෝ එහි බලධාරීන්ගෙන් හෝ මූලාශ්‍රවලින් හෝ තොරතුරු ලබා ගත් බවට සාක්ෂියක් නැත. උන් වහන්සේ කව්රුන් හෝ කියපු කතන්දර කොමිසමට කියා ඇත.

- අපට විරුද්ධව සාක්ෂි දුන් තවත් අයෙකු වනුයේ ඉස්ලාම් ධර්මය හා එහි සාස්තෘවරයා වන මුහම්මද් වක්තෘ තුමානන්ට නින්දා අපහාස වන ප්‍රවෘත්ති තමන්ගේ ෆෙස්බුක් හි පළකරන්නෙක්. මොහුට කොමිසමේදී මාව (හජ්ජුල් අක්බර්) හරස් ප්‍රශ්න කිරීමට අවස්ථාව දෙන ලදී. මට ඒ සම්බන්ධව කිසිම පෙර දැනුම්දීමක් කර තිබුණේ නැත. එම හරස් ප්‍රශ්න කිරීමේදී ඔහු කියා සිටියේ 1995 වර්ෂයේ මාදම්ප පල්ලියේ ශිෂ්‍යයන් වෙනුවෙන් සංවිධානය කර තිබූ වැඩසටහනකදී සම්පත්දායකයෙකු වශයෙන් සහභාගි වූ මා ඉස්ලාමීය රාජ්‍යයක් ස්ථාපිත කළ යුතු බව කී බවත්, මුස්ලිම්වරුන් සුළු ජාතියක් වශයෙන් සිටින කල එය කොතෙක් දුරට කළ හැකි දැයි ඇසූ ප්‍රශ්නයකට ඉන්දියාව උදාහරණයකට ගෙන මුස්ලිම්වරුන් සුළු ජාතීන් වශයෙන් සිටියදී ඉන්දියාව පාලනය කළ බව මා පිළිතුරු

දුන් බවත් කීවේය. 1995 යනු දැනට වසර 25 ට කලින් නිසා එවැන්නක් මතක් කරගත නොහැකි යැයි මා ප්‍රතික්ෂේප කළ අතර එවැනි අදහසකින් මා නොසිටි බවට සාක්ෂියක් වශයෙන් එවන් අදහසක් ඉදිරිපත්කල එවකට ඉස්ලාහියාවේ විදුහල්පතිව ඉවත් කළ බවත් ඔහුගෙන් අන්තවාදය පොවනු ලැබූ ශිෂ්‍යයින් මා හරිමගට ගෙනා බවත් සඳහන් කළෙමි. එබැවින් පළකළ එම අදහසත් පදනම් විරහිත ද්වේශ සහගත එකකි.

- අපට විරුද්ධව සාක්ෂි දෙන්නට ඉඩ ඇති තවත් පිරිසක් වනුයේ ජමාඅතේ ඉස්ලාමියෙන් හා ඉස්ලාමීය ශිෂය සංවිධානයෙන නෙරපනු ලැබූ අයවළුන්ය. මා CID සහ TID වල සිටියදී එහි නිලධාරීන් මට කිව්වේ ඔවුන් මට විරුද්ධව කරුණු ඉදිරිපත් කරන බවය.

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමියෙන් ඉවත් කරනු ලැබූ මාගේ සහෝදරයා වන ඉබ්‍රාහීම් මෞලවි, මුන්සිෆ් සහ ශිෂ්‍ය සංවිධානයේ 15 දෙනෙකු වූහ. ඔවුන් සියලුදෙනාම නෙරපනු ලැබුවේ එකම හේතුවකටය. එනම් අන්තවාදී අදහස් දැරූ ඉව හෙළිවූ නිසාය.

ශිෂ්‍ය සංවිධානයේ ජාතික සංවිධායක වශයෙන් කටයුතු කළ සාදික් අබ්දුල්ලා (මොහු මාගේ සහෝදර ඉබ්‍රාහීම්ගේ පුතාය. මාවනැල්ල බුදු පිළිම හානිය සිද්ධියේ ප්‍රධාන සැකකරු මොහුය. දැනට අත්අඩංගුවේ පසුවේ.) 2014 වසරේ අලුත්ගමදී මුස්ලිම්වරුන්ට එරෙහිව සිදුවූ ජාතිවාදී කෝලාහලයෙන් පසු මුස්ලිම්වරුන්ට විරුද්ධව ඇතිවන කෝලාහල නැවත්විය යුතු බවත් අපත් පාරට බැසිය යුතු බවත් කථා කරන තත්තවයට පත්විය.

මේ සම්බන්ධයෙන් මා සමගද ඔහු කථා කළේය. එවිට නීත්‍යානුකූල සාමකාමී ක්‍රියාමාර්ගවලින් මෙවැනි ප්‍රශ්නවලට මුහුණදිය යුතු බවත් ප්‍රචණ්ඩත්වය තෝරාගත නොහැකි බවත් එය

ආගමට සහ අපේ රටේ නීතියට පටහැනි බවත් අප සංවිධානයේ ව්‍යවස්ථාවටත් විරුද්ධ බවත් කරුණු පැහැදිලි කර දුන්නෙමි. එවිට මා සිතුවේ යම් මතවාදයක් වශයෙන් ඔහු මෙවැනි කථා කියන බවයි.

මෙය මෙසේ තිබියදී සාදික් අබ්දුල්ලා තමා සාමාජිකත්වය ලබන ශිෂ්‍ය සංවිධාන නායකත්වයේ විශ්වාසය කඩකරන ආකාරයෙන් ඔවුනට විරුද්ධ මතවාදයක් සාමාජිකයන් අතර රහසිගතව ප්‍රචාරය කරන බවත් තමන්ට සහය දෙන කණ්ඩායමක් හදා ගැනීමට උත්සාහ කරන බවත් ශිෂ්‍ය සංවිධානයට දැන ගන්නට ලැබී ඇත.

ශිෂ්‍ය සංවිධානයේ කැළඹිල්ලක් ඇති කරන මෙම ප්‍රයත්නය දැනගත් එහි ඇතැම් සාමාජිකයින් විසින් එය ශිෂ්‍ය සංවිධානයේ එවකට සභාපති සුෆ්යාන්ට දන්වා ඒ හරහා ජමාඅතේ ඉස්ලාමියේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් වෙතට එම කාරණය ඉදිරිපත් කරන ලදී.

ඒ පිළිබඳව විමර්ශනයක් සිදු කළ ජමාඅතේ ඉස්ලාමියේ සාමාජිකයින් තිදෙනා වහාම සාදික්ව සංවිධානයෙන් නෙරපීමට කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත. වහාම රැස්වූ ශිෂ්‍ය සංවිධානයේ විධායක සභාව සාදික් ඉවත් කිරීමේ තීරණය ගෙන ඒ බව සියලු සාමාජිකයන්ට දන්වා සාදික් සමග සම්බන්ධතා නොපවත්වන ලෙසද උපදෙස් ලබා දී ඇත.

මෙය සිදුවූයේ බුදු පිළිම වලට හානි සිදු කිරීමට වසර 3 1/2 ට පෙර එනම් 2015 වර්ෂයේදීය.

- සාදික්ව අනුගමනය කළ ඔහුගේ සහෝදරයා වන ෂාහිද් අබ්දුල් හක් නමැත්තාද ශිෂ්‍ය සංවිධානයෙන් නෙරපන ලදී. ඔහු මෙන් සාදික් සමග කිට්ටු සම්බන්ධතා පැවැත්වූ තවත් 13 දෙනෙක් (එකතුව 15 ක්) හඳුනාගෙන ඔවුන්ද නෙරපීමට කටයුතු කරන ලදී. එසේ නෙරපන ලද අයගේ නාම ලේඛනයක්ද කෙමිසමට ලබාදී ඇත.

සාදික් ශිෂ්‍ය සංවිධානයෙන් නෙරපනු ලැබීම පිළිනොගත් ඔහුගේ පියා වන මෞලවි ඉබ්‍රාහීම් ශිෂ්‍ය සංවිධානය සහ සාදික්ව නෙරපීමට උපදෙස් දුන් අය දැඩිව විවේචනය කළේය. ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමියද ඔහුගේ දැඩි විවේචනයට ලක් විය.

මෙම තත්තවයේදී ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමියේ සාමාජිකයෙකු වූ සාදික්ගේ පියා වන මෞලවි ඉබ්‍රාහීම් නෙපරා දැමීමට ජමාඅතේ ඉස්ලාමිය කටයුතු කළේය. මෙය සිදුවූයේ බුදු පිළිමවලට හානි කිරීමේ සිද්ධියට මාස 8 ට පෙරය.

මෙසේ සංවිධාන දෙකෙන්ම ඉවත් කරනු ලැබූවන් පිළිබඳ විස්තර කොමිසමට ලබාදී ඇත.

සාදික් සමග සම්බන්ධතා පැවැත්වූ ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමියේ සංවිධානයේ සාමාජිකයෙකු වන මුන්සිෆ් නමැත්තාද එම කාලයේදීම නෙරපන ලදී. ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි සහ ඉස්ලාමීය ශිෂ්‍ය සංවිධානය විසින් ඉවත් කරනු ලැබූවන්ගේ විසතර අප විසින් විමර්ශන කොමිසමට ලබා දී ඇති තත්තවයකදී ඔවුන් අප ගැන සාක්ෂි දී ඇත්නම් සැබැවින්ම එය අපට විරුද්ධ එකක් වනු ඇත.

## 10. බුද්ධි අංශයට තොරතුරු ලබාදීම

සාදික් අබ්දුල්ලා සහ පිරිස ශිෂ්‍ය සංවිධානයෙන් නෙරපා දැමීමෙන් පසු කුමන කාර්යයක යෙදී සිටින්නේ දැයි අප දැනගෙන සිටියේ නැත. එහෙත් තරුණ පිරිසක් එකතු කරගෙන ඔවුන් පන්ති පවත්වන බව අපට තොරතුරු ලැබුණි. එම තත්තවය භයානක විය හැකි බව තේරුම්ගත් අපි වහාම බුද්ධි අංශයට දැනුම් දීම උචිත බව නිගමනය කර බුද්ධි අංශ නිලධාරියෙකු ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි ප්‍රධාන කාර්යාලයට කැඳවා මේ පිළිබඳ තොරතුරු ලබා දුන්නෙමි. එය සිදුවූයේ 2015 අවසානයේදීය

මේ පිළිබඳ විස්තරද කොමිසමට ලබාදී ඇත.

## 11 . සාදික් සම්බන්ධයෙන් කොමිසම මට විරුද්ධව කළ චෝදනාව

සාදික් අබ්දුල්ලාගේ ක්‍රියාව පිළිබඳව මගෙන් ප්‍රශ්න කළ නිලධාරීන් ඔහුගේ මෙම අයහපත් චර්යාවට හේතුව මා බව චෝදනා කළේය.

සාදික්ව තුර්කියට හා සිරියාවට යැවීමට අවශ්‍ය කටයුතු කළේ මා බවත් පසුව ඇතිවූ බිය හේතුවෙන් ඔහුව සංවිධානයෙන් ඉවත් කිරීමට මා කටයුතු කර ඇති බවත් ඔවුන්ගේ චෝදනාව විය.

එම චෝදනාවට මම ලබාදුන් පිළිතුරු

- මුදල් වියදම් කර කිසි කෙනෙකුව විදෙස් රටකට යැවීමේ තත්තවයේ ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමිය හෝ ශිෂ්‍ය සංවිධානය නොමැත.

- සාදික් මාස තුනක භාෂා අධ්‍යයනයකට යනබව ශිෂ්‍ය සංවිධානයට කියා තිබුණි. ඒ අනුව ඔහුට මාස තුනක වැටුප් රහිත නිවාඩුවක් අනුමත කර ඇත.

- මාස හතරකින් පසු ඔහු නැවතත් දිවයිනට පැමිණි විට නැවතත් සේවයට සම්බන්ධ කරගැනීමට ශිෂ්‍ය සංවිධානය කටයුතු කර ඇති බව පසුව දැන ගන්නට ලැබුණි.

- සාදික් ශිෂ්‍ය සංවිධානයෙන් නිවාඩු ලබාගෙන විදෙස් ගතවීම පිළිබඳව හෝ නැවත පැමිණ සේවයට සම්බන්ධවීම පිළිබඳව තීරණ ගැනීම මට සම්බන්ධ කාර්යයක් නොවෙයි. මෙවැනි තීන්දු තීර්ණ පිළිබඳව ශිෂ්‍ය සංවිධාන

අපප සමග සාකච්ඡා කරන්නේද නැත. ශිෂ්‍ය සංවිධානයේ සාමාජිකයෙක්ව ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමියට හොරෙන් විදෙස් රටකට යැවීමේ කිසිම අවශ්‍යතාවයක් මට නැත.

- මගේ සහෝදරයාගේ පුතා නිසා සාදික්ගේ විදෙස් ගමන් පිළිබඳව පවුල් මට්ටමෙන් මා දැන ගෙන සිටි බව සැබෑ වුනත් එය මාගේ පාලනයෙන් යුත් කටයුත්තක් නොවේ.

- තුර්කියට ගිය ඔහු ඒ හරහා සිරියාවට ගිය බව අප දැන ගත්තේ ඔහු අත්අඩංගුවට පත්වීමෙන් පසු පොලීසියට දෙන ලද සාක්ෂි පුවත්පත්වල පළවීමෙන් පසුවය.

- කිසිම අවස්ථාවක ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි කටයුතුවලට මම සාදික්ව සම්බන්ධ කර නැත. එවැනි අවශ්‍යතාවයක් තිබුණේද නැත.

- ඉහත සාධක මගින් සාදික් සම්බන්ධයෙන් කරන චෝදනා තරයේ ප්‍රතික්ෂේප කරමි.

  සාදික් සම්බන්ධයෙන් තවත් චෝදනාවක් මට එරෙහිව කර ඇත. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන නිලාම් නමැත්තෙකු සිරියාවේ අයි.එස්.අයි.එස් සංවිධානයට බැඳී සටනකදී මරණයට පත්වී ඇති බව පුවත්පත් වල පළවීමෙන් අනුතුරුව ඇතිවූ බිය නිසා සාදික්ව මා නෙරපා දැමූ බව එම චෝදනාවේ කියවේ.

- එම චෝදනාව මම ප්‍රතික්ෂේප කළෙමි. එයට හේතුව බියවීමට එහි කිසිම හේතුවක් නොතිබීමය. සාදික් අබ්දුල්ලාගේ සිතේ තිබුණු කිසිම සැලසුමක් ගැන මා දැන නොසිටි නිසා මට එවැනි බියක් ඇතිවීමට හේතුවක් තිබුණේ නැත.

- මේ කරුණු සලකා බැලීමේදී මට විරුද්ධව ඇති චෝදනා පදනම් විරහිත බව කොමිසමේ වාර්ථාවෙන්ම ඔප්පුවී ඇත.

## 12 . අල් හසනාතය ජිහාදයට පෙළඹවූයේ නැත.

මා අන්තවාදියෙක් යන්නට ඔවුන් ඉදිරිපත් කර ඇති තවත් සාධකයක් වනුයේ ජමාඅතේ ඉස්ලාමිය නිකුත් කරන අල් හසනාත් සඟරාවයි. අල් හසනාතය ජිහාදයට පොළඹවන බව ඔවූහු චෝදනා කරති. ජිහාද් සම්බන්ධයෙන් අල් හසනාතයේ පළවූ ලිපි කීපයක්ද ඔවුන් සාධක වශයෙන් පෙන්වා ප්‍රශ්න කළහ.

පලස්තීනය, ඇෆ්ගනිස්ථානය, කාශ්මීරය හා බොස්නියාව වැනි රටවල මුස්ලිම්වරුන්ට එරෙහිව සිදුවෙන ආක්‍රමණය හෙළා දකිමින් මුස්ලිම්වරුන් එම ආක්‍රමණයන්ට විරුද්ධව ආත්මාරක්ෂක සටන් කල බව අල් හසනාතයේ ලිපි කීපයක් පළවූ බව සැබෑය.

මුස්ලිම් ලෝකයේ සිදුවූ මෙවැනි සටන් වලදී සියලු මුස්ලිම්වරුන්ගේ හැඟීම තිබුණේ ඒ ආකාරයටය. එහෙත් පසුව එය බොඳවී ගියේය. එදා එම ලිපි කියවූ අය එම පරිසරය සැලකිල්ලට ගෙන ලෝක මුස්ලිම්වරුන්ගේ හැඟීම් පිළිඹිබු කරන ආකාරයෙන් ලියන ලද ඒවා බව දැන සිටියහ. එම ලිපි ආරක්ෂා කරමින් තවදුරටත් ඒවා ඉගෙන්වීමට කටයුතු කරේ නැත.

පාස්කු ඉරිදා සිද්ධියෙන් පසු ඉස්ලාමයට හා මුස්ලිම්වරුන්ට එරෙහිව ඇතිවී තිබූ මානසිකත්වය නිසා කලකට පෙර ලියන ලද ඒවා සොයා වර්තමානයට අයත් වර්ණ කණ්ණාඩියකින් බලන විට ඒවාට වැරදි අර්ථකථනයක් ලැබෙන බව ප්‍රතික්ෂේප කළ නොහැකිය. අද ඇතිවූ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලට එදා පළකළ ලිපි හේතුදායකවූ බව තර්ක කරති. මෙම චෝදනා-ාවට අපි විවිධ ආකාරයෙන් පිළිතුරු සපයා ඇත්තෙමු. ඒවා කෙටියෙන් මෙසේය.

- මුස්ලිම් ලෝකයේ එදා තිබූ සටන්කාමී පරිසරය පදනම් කරගෙන ප්‍රවෘත්ති හා නිර්මාණ පළකළ මිස ශ්‍රී ලංකාවේ ජිහාද් කළ යුතුය යන්න අවධාරණය කරන ආකාරයේ කිසිවක් ලියවී නැත.

- ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් ප්‍රචණ්ඩත්ව ක්‍රියාවලින් දුෂ්කරතාවලට පත්වූ අවස්ථාවල සංහිඳියාව, සහජීවනය, නීත්‍යානකූල එළඹුම් ආදිය අවධාරණය කරමින් පමණක් අල් හසනාතයේ ලිපි පළවීම විශේෂත්වයකි.

- අයි.එස්.අයි.එස් අන්තවාද කල්ලියේ ඉස්ලාමීය සළු පිලි ගලවා එහි සැබෑ තත්තවය පෙන්වන නිර්මාණ පළවිය. ඉස්ලාමීය අන්තවාදී කල්ලිවලට සහයෝගය දක්වා කිසිවිටකත් අල් හසනාතයේ ලිපි පළවී නැත. එයට අමතරව (කොමිසමට ඉදිරිපත් නොකළ) තවත් කාරණයක්ද සඳහන් කිරීමට කැමැත්තෙමි. එනම්

- එදා එම කාල පරිච්ඡේදයේ දී ලෝකයේ බොහෝ ප්‍රගතිශීලී ජනයා පක්ෂපාතිත්වය දැක්වූ කාරණයකට අල් හසනාතයේද පක්ෂපාතිත්වය හිමිවුනි. නිදසුනක් වශයෙන් රුසියානු ආක්‍රමණයට විරුද්ධව ඇෆ්ගන් ජනතාව කළ සටන ජිහාදයක් බව ඇමෙරිකාව පවා අවධාරණය කළේය.

- ඒ වගේම පලස්තීන ශ්‍රී ලංකා මිත්‍රත්ව සංගමයේ එකල නායකත්වය දැරූ වර්තමාන ආග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාද පලස්තීනයට නන් අයුරින් සහාය දැක්වූයේය.

ඇෆ්ගනිස්ථාන ජනතාවගේත් පලස්තීන ජනතාවගේත් නිදහස් හැඟීම් මෙසේ සියලුදෙනා විසින් උසස් කොට සලකන ලද පරිසරයක ඉස්ලාමීය සඟරාවක් වශයෙන්

එයට සහෝගය දක්වා ලිපි පළ කිරීම වරදක් වශයෙන් අප දුටුවේ නැත.

- කොමිසමට අප අවබෝධ කරදීමට උත්සාහ කළේ අල් හසනාතය යනු මුද්‍රිත ජන මාධ්‍යයක් බවත් එය කාලය නියෝජනය කරන ලියවිල්ලක් වශයෙන් පෙනී නොසිටින විටක කිසිවෙකුත් එය නොකියවන බවත්ය.

මෙම තත්තවයේදී වර්තමාන පාස්කු ත්‍රස්තවාදීන් අසූව දශකයේ අල් හසනාතය කියවා ජිහාද් චින්තනයට යොමුවූ බව කීම පදනම් විරහිත චෝදනාවකි. එය අප තරයේ ප්‍රතික්ෂේප කරමු.

## 13 . අන්තවාදීන් බිහිවුණේ කෙසේද ? අන්තවාදීන්ගේ සාක්ෂි

වර්තමාන අන්තවාදීන් බිහිවීමට අල් හසනාතය හේතුපාදක නොවූ බවට ඇති තවත් සාධකයක් වනුයේ අන්තවාදීන් ලබාදුන් සාක්ෂීන්ය. අන්තවාදීන්ගෙන් සාක්ෂි විමසීම් වලදී මේ බව පැහැදිලිව කියා ඇත. එනම් මුස්ලිම්වරුන්ට එරෙහිව සිදුවූ ප්‍රචණ්ඩත්වය නිසා ඔවුන් අන්තවාදයට පෙළඹුණු බව ඔවුන්ම සාක්ෂි දී ඇත.

එවැනි සාක්ෂි කොමිසම් වාර්ථාවේ අන්තර්ගත වී ඇත. බොදුබල සේනා සංවිධානය තහනමකට ලක් විය යුතුය; ඥානසාර හාමුදුරුවන්ට එරෙහිව පියවර ගත යුතුය වැනි නිර්දේශවලට හේතුපාදක වී ඇත්තේද එම කාරණාවන්ය. මුස්ලිම් තරුණයින් ප්‍රචණ්ඩත්වය කරා පෙළඹවීමට සිංහල අන්තවාදී සංවිධාන හේතු සාධක වී ඇති බව කොමිසම මෙමගින් පිළිගෙන ඇත.

කොමිසම් වාර්ථාවේ වෙළුම 1 පිටුව 144 සහ 145 දී සහරාන්

ප්‍රහාරය එල්ල කිරීම සඳහාවූ හේතු කියවී ඇත. ප්‍රහාරයට පෙර දින ගල්කිස්සේ නිවසක සහරාන් කළ කථාවකින් එය ඔප්පු වේ. ශ්‍රී ලංකාවේ ප්‍රහාරයක් දියත් කිරීම සඳහා වූ හේතු දහයක් විස්තර කිරීමේදී ඔහු පහත කරුණු සඳහන් කරයි

- කුලියාපිටියේ බොදු බල සේනා සංවිධානය දියත් කළ උද්ඝෝෂණයකදී ඌරෙකුගේ පින්තූර සහිත බෙනරයක අල්ලාහ් යනුවෙන් ලියා තිබීම.
- අල්ලාහ්ට පුනරුත්පත්තියක් ඇති බව ඥානසාර හාමුදුරුවෝ සඳහන් කිරීම.
- අප පණටත් වඩා ගරු කරන අල් කුර්ආනය ගිනි තබා විනාශ කිරීම
- මුස්ලිම් පල්ලි කඩා දැමීම
- මුස්ලිම්වරුන්ගේ ආර්ථිකය සහ ගෙවල් දොරවල් විනාශ කරීම
- බොරු චෝදනාවල් මත මුස්ලිම්වරුන්ගේ ඉඩම් අත්පත් කර ගැනීම

මුස්ලිම්වරුන් ඉලක්ක කොටගෙන දිගන සහ බේරුවල සිදුවූ කෝලාහල සම්බන්ධයෙන්ද සහාරාන් මෙහිදී අදහස් දක්වා ඇත.

කොමිසම් වාර්ථාවේ වෙළුම 1 පිටු අංක 15 වේ මෙසේ සඳහන්වී ඇත.

බහුතර සමාජයේ ඇති අන්තවාදී කණ්ඩායම්වලට ඔවුන්ගේ ක්‍රමයටම මුහුණදීම සඳහා සුළු ජාතික ප්‍රජාවල අන්තවාදී කණ්ඩායම් ඇති වී තිබේ. විශේෂයන්ම බහුතර ප්‍රජාවේ ඇතැම් අන්තවාදී කණ්ඩායම්වල ක්‍රියාකාරකම් අයි.එස් සහ අනෙකුත් අන්තවාදී කණ්ඩායම්වල අන්තවාදී ක්‍රියාවන්වලට මුලපුරා ඇත. ප්‍රහරායට පෙර සහරාන් නිකුත් කළ අවසාන පණිවුඩයේ මෙම ප්‍රහාරයට ඥානසාර හාමුදුරුවන් ඇතුළු කණ්ඩායම් හේතුවූ බව සඳහන්

කර තිබීම මෙහිදී අවධානයට ලක් කළ යුතු කාරණයකි.

මාවනැල්ලේ බුදු පිළිම හානි කිරීම සිදුවුයේ කෙසේද? යන මාතෘකාව යටතේ 2021 මාර්තු 5 වෙනි දින "විඩිවෙල්ලි" දෙමළ පුවත්පතේ 7 වෙනි පිටුවේ පළවූ ලිපියක මෙසේ සඳහන් වී ඇත.

"මාවනැල්ලේ බුදු පිළිම වලට හානි සිදුකරන ලෙස සහරාන් විසින් සාදික්ට හා ෂාහිද්ට නියෝගයක් පැනවී ඇත. ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ට විරුද්ධව සිංහලයින් විසින් දියත් කළ ප්‍රහාරවලට පළිගැනීමේ අරමුණෙන් මෙම අණ නිකුත් කර ඇත."

එම ලිපියේ කොමිසම ඉදිරියේ සාදික් කියූ බවට තවත් ප්‍රවෘත්තියක් පළවී ඇත. එනම්

"බුදු පිළිම වලට හානි කරන ලෙස සහරාන් තමන්ට අණ කළ බව සාදික් කියා ඇත. කුලියාපිටියේ බොදුබල සේනා සංවිධානය කළ උද්ඝෝෂණයක ඡායාරූපයක් පෙන්වා සාදික් මෙවැනි කෲර ක්‍රියාවකට පෙළඹවී ඇත. එම ඡායාරූපයේ අල්ලාහ් යනුවෙන් ලියන ලද යෙදුම ඌරෙකුගේ පින්තූරයක් සමග යා කර බෙනරයක පළ කර තිබුණු ආකාරය පෙන්වන ඡායාරූපයක් පළ කර තිබුණි.

ලංකාදීප පුවත්පතේ 2019 පෙබරවාරි 19 වෙනි දින කලාපයේ 18 වෙනි පිටුවේ වනාතවිල්ලු සම්බන්ධ ලිපියක් සම්පූර්ණ පිටුවේම පළවී තිබුණි. එහිදී ෂාහිද් තරුණයින්ට පන්ති පවත්වන ආකාරය පින්තූරයකින් පෙන්වා තිබූ අතර එහිදී මෙවැනි වාක්‍යයක් ද පළවී තිබුණි.

"ඔවුන් පල්ලි කඩන නිසා බුදු පිළිම විනාශ කළ යුතු බව නායකයා කියා ඇත."

මෙම ප්‍රවෘත්තිය පුවත්පතේ කොටුවක් තුළ පළ කර තිබුණි.

2021 පෙබරවාරි 27 වෙනි දින එනම් මෑතක නිකුත්වුණු Truth with Chamuditha යන වීඩියෝ වැඩසටහනේ ඥානසාර හාමුදුරුවන්ගෙන් පහත ප්‍රශ්නය යොමු කරන ලදී.

"පාස්කු ඉරිදි ප්‍රහාරයට දිනකට කලින් ගල්කිස්ස නිවාස සංකීර්ණයක දිවුරුම් දීම කළ අවස්ථාවේදී සහරාන් මෙසේ කියයිඃ ඥානසාර තේර අලුත්ගමේ කෝලාහල ඇති කිරීමෙන් පසු තමයි මගේ ඔලුව වෙනස් වුනේ. "ඔබ වහන්සේ මේ ගැන කුමක් කියන්නේ දැයි" චමුදිත විමසයි.

ඥානසාර හාමුදුරුවෝ මෙම ප්‍රශ්නයට කුමන පිළිතුරු ලබා දුන්නද නොමග ගිය තරුණයින්ගේ ඔලුව වෙනස් කළ හේතුව බවට ඔවුන්ම පෙන්වාදී තිබෙන කාරණය කිසිවෙකුටවත් ප්‍රතික්ෂේප කළ නොහැකිය.

මෙය දෙපැත් අන්තවාදීන්. (මුස්ලිම් අන්තවාදීන්, සිංහල අන්තවාදීන්) සිදු කළ වැරදි අහිංසක තුන්වැනි පාර්ශවය මතට තල්ලු කිරීමට තැත් කිරීමකි.

## 14 . මාව හඳුනන අය මා දෙස අන්තවාදියෙකු ලෙස බලන්නේ නැත.

මට එරෙහිව ඇති අන්තවාදී චෝදනාව තවත් කෝණයකින් මම ප්‍රතික්ෂේප කරමි. දැනට මගේ වයස අවුරුදු 60 යි. මෙතෙක් කල් මම මාගේ ප්‍රජාව තුළ උපයාගෙන ඇති කීර්ති නාමය මෙම චෝදනාව නිසා බින්දුවටම බැස්වීමට උත්සාහ කෙරේ. මගේ ප්‍රජාවේ කව්රුත් හඳුනන ප්‍රසිද්ධ පුද්ගලයෙක්. මගේ කථාව හා රචනය දෙවිඳුන්ගේ පිහිටෙන් මට එම කීර්ති නාමය ලබා දී ඇත. වෙනත් ආකාරයකට කියන්නේ නම් රටට හා සමාජයට ප්‍රයෝජනවත් වන ආකාරයෙන් මගේ චින්තනය පිහිටා තිබීම එම කීර්ති නාමයට හේතුවයි.

එවැනි චින්තන හා අදහස් මගින් මා පිළිබඳ දැනගත් අය, මාත් සමග ආශ්‍රය කළ අය, මගෙන් ප්‍රයෝජනය ලබාගත් අය, මා ප්‍රයෝජනය ලැබීමට උදව් කළ වශයෙන් දහස් සංඛ්‍යාවකින් යුත් වටයක් තිබේ. එවැනි අයගේ සාක්ෂිවලට

මිනිසෙකු තක්සේරු කිරීමේ අවස්ථාව දෙනු ලැබේද යන්න මට ඇති ප්‍රධාන ප්‍රශ්නයකි. මුස්ලිම් ප්‍රජාවේ මාව හඳුනන මෙවැනි බොහෝ පිරිස් සිටිති. මා සිතන්නේ මාව නොහඳුනන අය, කිසියම් ආකාරයකින් මා සමග එකඟ නොවන්නට හා රටේ නීතිය කඩ කළ ඇතැමුන්ගේ සාක්ෂිවලට වැදගත් තැනක් ලබාදී ඇති බවය. යහපත් සිත්වලින් පිරිනමන අය ප්‍රතික්ෂේප කර සහරාන්, සාදික් වැනි අප්‍රේල් ත්‍රස්තවාදීන්ගේ තොන්ඩුවේ මාවත් හිර කිරීමට තැත් කිරීම මාගේ හිසට වැදුණු මරු පහරකි.

## 15 . ජන මානසිකත්වය අන්තවාදයට විරුද්ධයි

ශ්‍රී ලංකා මුස්ලිම්වරුන් පොදුවේ දෙමළ ජනයා බහුතරයක් වාසය කරන ප්‍රදේශවල දෙමළ ප්‍රජාව සමගත් සිංහල ජනයා බහුතරයෙන් වාසය කරන ප්‍රදේශවල සිංහල ප්‍රජාව සමගත් අසල්වැසි සම්බන්ධතාවය ඉතා විශිෂ්ට ලෙස ආරක්ෂා කරමින් ජීවත් වෙති. වෙනත් ප්‍රජාවන් සමග ගැටුමක් ඇති කරගැනීමට මුස්ලිම්වරුන් කිසිවිටකත් ඉදිරිපත් වන්නේ නැත.

එවැනි සමාජ පරිසරයක ඉස්ලාමීය රාජ්‍යයක් ස්ථාපිත කිරීමේ ඉල්ලීම ඉදිරිපත් කරමින් මා මුස්ලිම්වරුන් පොළඹ වූයේ නම් එයට මුලින්ම වරුද්ධ වන්නේ මාගේ ප්‍රජාවයි. මා මුස්ලිම් ප්‍රජාවේ හතුරා බවට පත්වීම නියතයි. සහරාන්ගේ අන්තවාදයට මුස්ලිම් ප්‍රජාව විරුද්ධ වූයේද එම ආකාරයටය.

එයට වෙනස්ව මාගේ රචනය, කථාව හා චින්තය අනුමත කරන ප්‍රවණතාවයක් තවදුරටත් පවතී. 2019 අගෝස්තු 25 වෙනි දින මා අත්අඩංගුවට පත්වූ අවස්ථාවේදී මට පක්ෂව ලියූ අය කථා කළ අය ප්‍රාර්ථනා කළ අය මාව වහාම මුදවාහරින ලෙස ඉල්ලුම් කළ අය මා සම්බන්ධයෙන් තමන්ගේ ආයතනවල සංදේශ සම්මත කළ අය වශයෙන් සමාජ ප්‍රතිචාර ඉහළ මට්ටමින් දකින්නට තිබුණි. අවාසනාවකට මා ගැන සිංහල ප්‍රජාව

දැනුවත් නොමැති නිසා ඇතැම් සිංහල මාධ්‍ය පතුරවූ බොරුව, අහිංසක සිංහල මිනිසුන් විශ්වාස කරන්නට ඇත. එහෙත් මුස්ලිම් ප්‍රජාව එය විශ්වාස කළේ නැත. සිංහල මාධ්‍ය මා පිළිබඳව නොදැනුවත්ව සිටීම එයට හේතුවයි. පුද්ගලයෙකු පිළිබඳ සත්‍ය තත්තවය අවබෝධ කරගැනීමට විද්‍යාත්මක පර්යේෂණ වර්තමාන ලෝකයේ බොහෝ ක්‍රම විධි ඇත. එවැනි විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවලට කිසි ඉඩක් නොතබන ආකාරයේ චෝදනාවක් මට විරුද්ධව ඉදිරිපත්වී ඇත.

## 16 . ඉස්ලාමීය රාජ්‍යයක් සාර්ථක වන්නේ කෙසේද ? ඔබම පිළිතුරු දෙන්න

තවත් ආකාරයකින් මට එරෙහිවූ චෝදනාව ප්‍රතික්ෂේප කරමි.

ඉස්ලාමීය රාජ්‍යයක් බිහි කිරීමට මා කළ සැලසුම කුමක් ද? මගේ පසුබිමේ සිටි බලවේගයන් කුමක් ද? මේ විෂයෙහි මා සමග සමීපව සහෝයගය දුන් කණ්ඩායම කව්රුන්ද? යනුවෙන් කව්රුන් හෝ ප්‍රශ්න කළ විට එයට ලැබෙන පිළිතුරු බිංදුව විය හැකිය.

හේතුව එම කණ්ඩායම කොහෙත්ම ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමීය විය නොහැකිය. ඔවුන් කවදත් මෙම චින්තනයට විරුද්ධයි. මා ඉස්ලාමීය රාජ්‍යයක් ස්ථාපිත කිරීමේ උත්සාහයේ නිරතවූයේ නම් මට එරෙහිව වන පළමු කණ්ඩායම ජමාඅතේ ඉස්ලාමය බව මම කලින්ම සඳහන් කර ඇත්තෙමි.

එපමණක් නොව ඉස්ලාමීය රාජ්‍යය යනු ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමීය අනුමත නොකළ කාරණයකි. ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමීය එහි ආරම්භයේ සිටම ලිඛිත ව්‍යවස්ථාවක් සහිතව

කටයුතු කරන බව මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුය.

වසර හතරකට වරක් ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමී සංවිධානයේ පැවැත්වෙන සභාපති තෝරාගැනීම සඳහාවූ නිලවරණයේ රහස්‍ය ඡන්දයෙන් වසර විසි හතරක් පුරාම මාව තෝරාගැනීමට එහි සාමාජිකයින් කටයුතු කර ඇත. මෙය තවදුරටත් මට කළ නොහැකි බව කිහිපවතාවක් බැගෑපත්වී ඇතත් ඔවුන් නැවත නැවතත් මාවම තෝරාගත්හ. අවසානයේ නොකඩවා වාර දෙකකට වඩා සභාපති ධූරය දැරිය නොහැකි බව ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන ඒමෙන් පසුවයි මට සභාපතිත්වයෙන් මිදීමට අවස්ථාව ලැබුණේ.

මා අත්අඩංගුවට පත් අවස්ථාවේ මාගේ දුරකථන සම්බන්ධතා පුළුල් වශයෙන් විමර්ශනයට ලක් කරන ලදී. නීති විරෝධී කිසිම සම්බන්ධතාවයක් නොතිබුණු බව එම විමර්ශනයේ ප්‍රතිඵලය විය.

එසේ නම් ඉස්ලමීය රාජ්‍ය ස්ථාපිත කිරීම් කුමන්ත්‍රණය මා සැලසුම් කළේ කා සමග දැයි ඔවුන් සොයා බලන්නට ඇත. මුස්ලිම් දේශපාලඥයින් සමග ඇති සම්බන්ධතා ගැන ඔවුන් මගෙන් ප්‍රශ්න කළහ. ඔවුන් සමග සැලකිය යුතු කිසිම සම්බන්ධතාවයක් නොමැති බව ඔවුනට අවබෝධ විය.

මෙවැනි සැකයක්ද ඔවුන් අවසානයේදී මතු කළහ. රජයේ උසස් තනතුරු වල පුද්ගලයින් පිහිටුවා ඔවුන් ලවා මෙම කුමන්ත්‍රණය කරන බවට චෝදනා කළහ. රජයේ උසස් තනතුරු වලට පුද්ගලයින් පත් කරන තරමට මා බලවත් අයෙක් දැයි විමසුවෙමි. ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමීය සාමාජික ලැයිස්තුව විමර්ශන නිලධාරීන්ට ලබාදී උසස් තනතුරු වල සිටින්නන් කව්රුන්ද යනුවෙන්ද විමසා සිටියෙමි. එම විමර්ශනයේදී ද සැක සහිත යමක් ඔවුන්ට සොයාගැනීමට නොහැකිවිය.

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමීය සංවිධානයේ ව්‍යවස්ථාවේ "මාර්ගෝපදේශ සංකල්ප" යන මාතෘකාවේ අපගේ ක්‍රියාකාරකම් සඳහා වූ සීමාවන් පෙන්වා දී ඇත. "පක්ෂ දේශපාලනයේ නිරත නොවෙමු.", "කිසිම විදේශීය හෝ දේශීය සංවිධාන සමග පාලනයෙන් යුතු නිල සම්බන්ධතාවක් නොපවත්වා නිදහස්ව කටයුතු කරමු.", "ශ්‍රී ලංකාවේ නීතියට අනුවම ක්‍රියාකරමු." ආදී වශයෙන් අපගේ ක්‍රියාකාරී සීමාවන් නියම කර ඇත.

මෙවැනි සීමාවක් තුළ කටයුතු කරමින් ඉස්ලාමීය රාජ්‍යයක් බිහි කරන්නේ කෙසේදැයි මා පෙරලා අසා සිටියෙමි.

ආයුධ නැතුව නීත්‍යානුකූලව කටයුතු කරමින් දේශපාලනයෙන් තොරව කිසිම දේශීය විදේශීය සංවිධාන සමග පාලනමය සම්බන්ධතාවයෙන් තොරව අපේ කටයුතු සාමකාමී ආකාරයෙන් සිදු කරමු. උද්ඝෝෂණ පැවැත්වීමේ සංස්කෘතියක්ද අපේ සංවිධානයේ නොමැත. දේශපාලන බලවතුන් හෝ ධනවතුන් හෝ රජයේ උසස් තානාන්තරවල නිලධාරීන් හෝ අප සංවිධානයේ නොමැත. දැඩි මතවාදීන් අප සංවිධානයේ නොමැත. එවැනි අය අප සංවිධානය තෝරා ගන්නේ නැත. එවැනි අය බඳවා ගැනීමට අපේ කැමැත්තක්ද නැත. සාදික් වැනි අන්තවාදී චින්තනයක් ඇති අයට ජමාඅතේ ඉස්ලාමීයේ හෝ ශිෂ්‍ය සංවිධානයේ හෝ දිගු ආයු කාලයක් නැත.

ඉතින් ඉස්ලාමී රාජ්‍යයක් ස්ථාපිත කිරීම යන භාරදූර අභූත චෝදනාව අපට විරුද්ධව නගන්නේ මක් නිසාද?

# 17 . හජ්ජුල් අක්බර්ගේ ස්ථාවරය

මෙම හජ්ජුල් අක්බර් මහාතට මෞලවි සහතිකයක් නැති බව කොමිසම් වාර්ථාවේ සඳහන් වී ඇත. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලා උපාධියක් හැරුණු කොට වෙනත් උසස් අධ්‍යාපන සුදුසුකම්ද ඔහුට නැත. ඔහු දේපළ සතු ධනවතෙකුද නොවේ. සෙසු අය සමග ගැටීමට තරම් ශක්ති සම්පන්න දේහදාරී පුද්ගලයෙකුද නොවේ.

ඇෆ්ගනිස්ථානයට ගොස් යුධ පුහුණු ලැබූ බවට තවත් චෝදනාවක් වේ. එම චෝදනාව විමර්ශනය කර ප්‍රතික්ෂේප වූ එකක් බව නැවතත් මතක් කරමි. තම එකම සහෝදරයා වන ඉබ්‍රාහීම් මෞලවි සහ ඔහුගේ පවුල අන්තවාදය නිසා තරහ කරගෙන සිටින හජ්ජුල් අක්බර්ව අන්තවාදියෙක් කිරීමට කොමිසම උත්සාහ දරා තිබීම ආශ්චර්‍යජනකය. සාදික් අබ්දුල්ලා කල්ලි හදාගෙන ක්‍රියාත්මක වන තත්තවයකට නොගොස් සිටියේ නම් ඔහුව යහපත් අතට හැරවීමේ අවකාශය මට භාරගන්නට තිබුණි. එහෙත් රහසිගතව කල්ලි ගසමින් ක්‍රියාකිරීමට පටන් ගැනීමෙන් පසු එය කළ නොහැකි විය. එහෙත් ඔවුන්ගේ නිවසටම ගොස් කිහිපවතාවක්ම උත්සාහ කළෙමි. ඔවුන්ගේ ඔලුව වෙනස්වී තිබුණු නිසාදෝ එම උත්සාහය සාර්ථක නොවුණි. ඔවුන් යහමගට පත්වී හැදී යහපත් ජීවිතයක් ගත කිරීම මගේ ප්‍රාර්ථනාව සහ අපෙක්ෂාවයි. අන්තවාදී චින්තනයෙන් ඔහු සහ ඔහුගේ සඟයින් මුදවා ගැනීමට අවස්ථාවක් ලැබේ නම් මෙරටේ ප්‍රමුඛත්වය දිය යුතු කර්තව්‍යයක් වශයෙන් එය සලකා දිවා රෑ නොබලා වෙහෙස වීමට කැමැත්තෙමි.

එවැනි කර්තව්‍යයක් මට කළ හැකි බව මගේ විග්‍රහයන් වලට කන් දීමෙන් පසු සඳහන් කළ විමර්ශන නිලධාරීන් කිහිපදෙනෙක් පිළිබඳවද මට මතක්වේ. එවැනි කාර්යයකට මම කවදත් සූදානමින් සිටිමි. කොමිසම් වාර්ථාව හා චෝදනා මා තුල ඇති කර ඇති

කැළඹීම හේතුවෙන් මා මෙසේ කථා කරනවා නොවේ. ලෝක සිදුවීම් සැමදාම යහපත්ම වන්නේ නැත යන යථාර්තය මම අවබෝධ කරගෙන සිටිමි. එම යථාර්තය ඇතැමුන්ගේ යහපත සඳහා තවත් ඇතැමුන් බිලිදීමක් වශයෙන්ද විය හැකිය. එහෙත් යථාර්තයට පිටුපා යන්නට බැරිය. යථාර්තය කිසියම් කාලයක සත්‍යයට සමීප ලෙසද වෙනස්විය හැකිය. එතෙක් ඉවසීමෙන් සිටීම යහපත් අයට සුදුසු කාර්යයකි.

## 18 . අවසාන වශයෙන්...

යමෙකු අවබෝධය කරගනු ඇතැයි යන අපේක්ෂාවෙන් මාගේ බලාපොරොත්තු කිහිපයක් බෙදා ගනිමි.

- ❖ පාස්කු ඉරිදා ප්‍රහාරයේ වැරදි කරුවන්ට දඬුවම් ලබා දීමට කටයුතු කලයුතුය.
- ❖ අපරාධයන් සිදු කිරීමට අනුන් විසින් පොළොඹ වූවන් සහ ස්වයං අභිප්‍රේරක අපරාධකරුවන් වෙනස්කර දඬුවම් කළ යුතුය.
- ❖ අපරාධකරුවන් සමග සම්බන්ධතා පැවැත්වූ අයවලන් අනාගතයේ අපරාධකරුවන් නොවීමට කටයුතු කළ යුතුයි.
- ❖ සැක කටයුතු පුද්ගලයින් වෙත යහපත් ප්‍රවේශයකින් අනුගත වෙමින් සැකෙන් තොර අවධියකට ගෙන ආ යුතුයි.
- ❖ මුස්ලිම් වරුන් තුළ ඇතිවිය යුතු වෙනස ඔවුන්ද ශ්‍රී ලාංකිකයන් යන අන්‍යයෝනය අවබෝධයෙන් යුක්තව ළඟා වී තීරණවලට එළඹීම, එවිට එය පැනවූ වෙනස්කම් ලෙස ඔවුන් සලකන්නේ නැත.

**ජනතාවගේ සෞභාග්‍යමත් අනාගතය**

**රටේ යහපත් අනාගතයවේ.**